# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2405/33 – 2024 ඔක්තෝබර් මස 10 වැනි බ්‍රහස්පතින්දා – 2024.10.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2017/208.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.01.22 දිනැති හා අංක 2055/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.01.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 21, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ශාඛාව හි පිහිටි ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය 2. කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 21 හි පිහිටි රක්ෂණ සේවක සංගමය 3. කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 21, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ශාඛාව හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය සහ කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 21 හි පිහිටි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/07//2018 හා 2024.08.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 සැප්තැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: IR/COM/03/2017/208.

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.

1. ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය
   ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ශාඛාව,
   අංක 21, වෝක්ෂෝල් වීදිය,
   කොළඹ 02.

2. රක්ෂණ සේවක සංගමය
   අංක 21, වෝක්ෂෝල් වීදිය,
   කොළඹ 02.

3. අන්තර් සමාගම් සේවක සංගමය
   ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ශාඛාව,
   අංක 21, වෝක්ෂෝල් වීදිය,
   කොළඹ 02.

*පළමුවැනි පාර්ශ්වය*

නඩු අංකය: A/07/2018.

සහ

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්
අංක 21, වෝක්ෂෝල් වීදිය,
කොළඹ 02.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවතින ආරාවුල.

**ප්‍රදානය**

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2018.01.17 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ:

> "ප්‍රවාහන දීමනාවක් ලබන විධායක නිලධාරීන් සඳහා රු. 10,000/- ක අමතර ප්‍රවාහන දීමනාවක් ලබා දීමෙන් වැටුපෙන් 10% ක ප්‍රවාහන දීමනාවක් ලබන විධායක නොවන ශ්‍රේණිවල සේවකයින් සඳහා අසාධාරණයක් සිදු වී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද? යන්නත් පිළිබඳව වේ".

**පෙනී සිටීම**

මෙම නඩුවේ පළමුවැනි පාර්ශ්වයේ පළමුවැනි වෘත්තිය සමිතිය වන ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය නියෝජනය කරමින් එහි ශාඛා ප්‍රධාන ලේකම් දිලීප දිසානායක මහතා පරීක්ෂණය පැවැත්වූ සෑම දිනකම පාහේ සහභාගි විය. ඊට අමතරව එකී සංගමය නියෝජනය කරමින් එච්. එල්. සුගත් මහතාත්, ඒ. ඒ. රුවන් රූපමාල් මහතාත් ඇතැම් දිනවල සහභාගි වූහ. පළමුවැනි පාර්ශ්වයේ දෙවැනි වෘත්තිය සමිතිය වන රක්ෂණ සේවක සංගමය නියෝජනය කරමින් එහි සභාපති ඊ. ඩබ්ලිව්. යූ. ආර්. දිවාකර මහතා 2022.05.27 දින දක්වා සහභාගි වූ අතර ඉන් පසු පරීක්ෂණ දිනයන්හි දී ඔහු වෙනුවට අලුතෙන් පත් වූ සභාපති ආර්. එස්. නන්දලාල් මහතා සහභාගි විය. ඊට අමතරව එම සංගමයේ උපලේකම් ප්‍රියංකර බමුණුගම මහතාත්, විධායක සභික සචිත් සේනාරත්න මහතාත් ඇතැම් දිනවල පරීක්ෂණයට සහභාගි වූහ. පළමුවැනි පාර්ශ්වයේ තුන්වැනි වෘත්තිය සමිතිය වන අන්තර් සමාගම් සේවක සංගමය නියෝජනය කරමින් එහි ලේකම් ඉන්දික පනාගොඩ මහතා පරීක්ෂණය පැවැත්වූ බොහෝ දිනවල සහභාගි විය. ඇතැම් දිනවල එහි සභාපති තරංග සම්පත් මහතා ද සහභාගි විය. බේරුම්කරණ විභාගය අවසන් වන දින තෙක් පළමුවැනි පාර්ශ්වයේ පළමුවැනි සහ දෙවැනි වෘත්තිය සමිති වෙනුවෙන් නීතිඥ ඉන්දුල හේවාගේ මහතා සමග නීතිඥ නලින් අමරජීව මහතා පෙනී සිටියේ ය. ඉහත තුන්වැනි වෘත්තිය සමිතිය වෙනුවෙන් නීතිඥ ජානක අධිකාරි මහතා දින කීපයක දී පරීක්ෂණයේ දී පෙනී සිටියේය.

දෙවැනි පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් කළමනාකරු (සේවක සබඳතා) නීතිඥ ඉඳුනිල් නවරත්න මහතාත්, විධායක නිලධාරී නීතිඥ තරිඳු චතුරංග මහතාත් පරීක්ෂණය පැවැත්වුණු සෑම දිනකම පාහේ සහභාගි විය. ඇතැම් දිනවල රක්ෂණ සහායක ගෙහාන් කුලසූරිය මහතා සහභාගි විය. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නඩුවේ ආරම්භයේ සිට ලංකා සේව්‍ය සම්මේලනය නියෝජනය කරමින් නීතිඥ යශෝරාවී බක්මීවැව මහත්මිය සහ නීතිඥ නිකිත සේනාරත්න මහතා පෙනී සිටියහ.

**බේරුම්කරණ විභාග පටිපාටිය**

මෙම නඩුව 2018.08.28 දින පළමු වතාවට කැඳවනු ලැබුණි. ගොනු කරන ලද පළමු සහ දෙවැනි ප්‍රකාශයන් පාර්ශ්වයන් දෙකට ම හුවමාරු කර භාරදෙනු ලැබ, ඒවා ද සැළකිල්ලට ගෙන විභාගයකට අවතීර්ණ නොවී දෙපාර්ශ්වයේ එකඟතාව මත කිසියම් සාධාරණ සමථයකට එළඹිය හැකි ද යන්න පිළිබඳ දැඩි උත්සාහයක් ගන්නා ලදී. එබඳු සමථයකට දෙපාර්ශ්වය ගෙන ඒම අපහසුවූයෙන් විභාගය ඇරඹුණි. නඩුව 2018.08.28, 2018.09.21, 2018.10.25, 2018.11.05, 2019.01.08, 2019.03.07, 2019.05.10, 2019.06.27, 2019.10.02, 2019.11.25, 2020.07.06, 2020.08.12, 2020.09.08, 2022.01.10, 2022.03.31, 2022.05.27, 2019.10.04, 2022.11.10, 2023.02.21, 2023.05.09 සහ 2023.07.18 යන දිනයන් 2 කට කැඳවා විභාගය පවත්වන ලදී. දින නියම කරන ලද නමුත් 2018.10.01, 2019.07.26, 2020.01.20, 2020.10.13, 2022.02.11, 2022.06.23 සහ 2022.12.13 යන දිනයන්හි දී පරීක්ෂණ විභාගය නොපැවැත්විණි.

බේරුම්කරණ විභාගය ආරම්භයේ දී ම මෙම යොමුව සම්බන්ධයෙන් පහත සඳහන් මූලික විරෝධතා ගොනු කරන ලදී.

1. බේරුම්කරණයට යොමු කරන ලද මෙම යොමුව සදොස් බව සහ නෛතික ප්‍රතිපාදන ඇතුලත නොපවතින බව.
2. යොමුවේ සඳහන් ආකාරයේ රු. 10,000/- ක මාසික ප්‍රවාහන දීමනාවක් අදාළ විධායක කාණ්ඩවලට අයත් නිලධාරීන්ට දෙවැනි පාර්ශ්වයේ ආයතනය විසින් ගෙවන්නේ නැති බව.
3. එකී ප්‍රශ්නගත රු. 10,000/- දීමනාව එතෙක් ගෙවමින් සිටි මාසික වාහන කුලී දීමනාව වැඩිකිරීමක් මිස අමතර ප්‍රවාහන දීමනාවක් ගෙවීමක් නොවන බව.
4. යොමුව කරුණුමය වශයෙන් වැරදි පූර්ව නිගමනයන් මත සකස්කොට ඇති බැවින් එය අනීතික සදොස් යොමුවක් බව.

එකී මූලික විරෝධතාවන් දෙපාර්ශ්වයම විසින් ගොනුකරන ලද ලිඛිත සැලකිරීම් සහ වාචික සැලකිරීම්වලින් ඉදිරිපත් කරන ලද කරුණු සැළකිල්ලට ගෙන බේරුම්කරණය විසින් තීන්දුවක් දෙන ලදී. එකී විරෝධතාවන් පිළිගෙන බේරුම්කරණ විභාගය මුලින්ම අත්හැර දැමුවහොත් ඉන් ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වයට අගතියක් සිදුවීම වැළැක්වීම සඳහා පරීක්ෂණය දිගටම පැවැත්වීමට තීරණය කරන ලදී.

පරීක්ෂණය පැවැත්වීමේ පහසුව තකා දෙපාර්ශ්වයේ එකඟතාව ඇතිව, පිළිගැනීම් 13 ක් ද, විසඳනාවන් දෙකක් ද තීරණය කොට සටහන් කරන ලදී. පරීක්ෂණය පැවැත්වීමේ දී සහ මෙම ප්‍රදානය පිළියෙල කිරීමේ දී එකී පිළිගැනීම් බෙහෙවින් උපකාරී විය. තීරණය කරගත් විසඳනාවන් දෙක පහත සඳහන් පරිදි වේ.

1. ප්‍රවාහන දීමනාව ලබමින් සිටි විධායක නිලධාරීන් සඳහා රු. 10,000/- ක අමතර ප්‍රවාහන දීමනාවක් ලබාදීමෙන් වැටුපෙන් 10% ක ප්‍රවාහන දීමනාවක් ලබන විධායක නොවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අසාධාරණයක් සිදු වී තිබේ ද යන්න.
2. එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔවුන්ට හිමි විය යුතු සහනයන් කවරේ ද යන්න.

මෙම බේරුම්කරණ විභාගයේ දී හබයකින් තොරව පළමුවැනි පාර්ශ්වය සාක්ෂි විභාගය පළමුවෙන් ආරම්භ කළ අතර, එම පාර්ශ්වය වෙනුවෙන් සහනය පතන වෘත්තිය සංගම් අතුරෙන් රක්ෂණ සේවක සංගමයේ එවකට සිටි සභාපති ඊ. ඩබ්ලිව්. යූ. ආර්. දිවාකර මහතාගේ සාක්ෂිය විභාග කෙරුණි. පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් මෙහෙයවනු ලැබූ එකම සාක්ෂිය එය පමණක් වූ අතර A1 සිට A30(1) දක්වා ලේඛන ලකුණු කරමින් පළමුවැනි පාර්ශ්වයේ නඩුව අවසන් කරන ලදී. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී (වැඩ බලන) මාලක බණ්ඩාර මහතාගේ සාක්ෂිය මෙහෙයවනු ලැබුණි. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් R1 සිට R6 දක්වා ලේඛන ලකුණුකොට ඉදිරිපත් කෙරුණි.

පළමුවැනි පාර්ශ්වය විසින් ලකුණු කරන ලද ලේඛන ඔවුන්ගේ අවසන් සැළකිරීම්වලට අමුණා නොතිබුණු බව සටහන් කෙරේ.

සාක්ෂි විභාගය අවසානයේදී ඉහතින් සඳහන් කරන ලද විසඳනාවන් දෙක සම්බන්ධයෙන් බේරුම්කරණය විසින් දැනුවත් කිරීමක් කරන ලදී. ආයතනයේ විධායක ශ්‍රේණිවල නිලධාරීන්ට රු. 10,000/- ක අතිරේක ප්‍රවාහන දීමනාවක් ගෙවීමෙන් පළමුවැනි පාර්ශ්වයේ වෘත්තීය සමිති නියෝජනය කරන සාමාජිකයින් අසාධාරණයකට ලක්වී ඇත්ද යන්න පිළිබඳව තීරණයක් ගැනීමට ප්‍රමාණවත්ව සාක්ෂි මෙහෙයවන ලද නමුත් දෙවන පාර්ශ්වයට යම් අසාධාරණයක් වී නම්, ඔවුන් පතන සහනයන් පිළිබඳ කිසිදු සඳහනක් බේරුම්කරණ විභාගයේ දී සිදුනොවුණු බව දැනුවත් කිරීමක් බේරුම්කරණයෙන් සිදු කෙරිණි. ඒ අනුව බේරුම්කරණ විභාගය අවසන් කිරීමට පෙර පළමුවැනි පාර්ශ්වය පතන සහනයන් දෙවන පාර්ශ්වයට පිටපත් සහිතව ඉදිරිපත් කිරීමටත්, එම ඉල්ලීම් පිළිබඳව විරෝධතා ඇතොත් ලිඛිත සැලකිරීම් මාර්ගයෙන් ඒවා ඉදිරිපත් කිරීමට දෙවැනි පාර්ශ්වයට අවස්ථාව සලසාදීමත් කරන ලදී. ඒ අනුව පළමුවැනි පාර්ශ්වය විසින් 2023.05.09 දිනැතිව සේවක නාම ලේඛනයක් හා ඔවුන්ට හිමි විය යුතු ප්‍රවාහන දීමනා හිඟ මුදල් ආදිය ඇතුත් ලේඛනයක් ඉදිරිපත් කරන ලද අතර, ඊට දෙවන පාර්ශ්වය විසින් විරෝධතාවක් 2023.08.31 දිනැතිව ඉදිරිපත් කර තිබුණි.

**පළමුවැනි පාර්ශ්වයේ ස්ථාවරය**

පළමුවැනි පාර්ශ්වය විසින් පරීක්ෂණය ආරම්භයේ දී ඉදිරිපත් කරන ලද පළමුවැනි සහ දෙවැනි ප්‍රකාශයන්ගෙන් ද, මෙහෙයවන ලද සාක්ෂි මගින් ද, සැලකිරීම් මගින් ද ගොඩනැගු ස්ථාවරයන් සම්පිණ්ඩනය කොට පහත දක්වමි.

- මෙම ආරාවුල නිසා පීඩාවට පත් වූ සේවක කණ්ඩායම් නියෝජනය කරමින් ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, අන්තර් සමාගම් සේවක සංගමය සහ රක්ෂණ සේවක සංගමය යන වෘත්තීය සමිතිවලින් කෙරෙන පැමිණිල්ල මෙම යොමුවට අදාළ වේ.

- 2013 සිට 2016 දක්වා කාලයට අදාලව ආයතනය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය සහ රක්ෂණ සේවක සංගමය යන වෘත්තීය සමිති සමග සාමූහික ගිවිසුමක් ඇතිකරගෙන ඇති අතර, එම ගිවිසුමෙන් ප්‍රවාහන දීමනාවක් භුක්ති නොවිඳින විධායක ශ්‍රේණියේ නිලධාරීන් සහ විධායක නොවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා 10%ක ප්‍රවාහන දීමනාවක් ගෙවීමට එකඟ වී ඇත.

- ඒ අනුව ප්‍රවාහන දීමනාවක් භුක්ති නොවිඳින විධායක සහ විධායක නොවන නිලධාරීන්ට තම මූලික වැටුපෙන් ගණනය කරන ලද 10% ක ප්‍රවාහන දීමනාවක් ලබාගත්හ.

- 2016 සිට 2019 දක්වා කාල පරිච්ඡේදයට බලපැවැත්වෙන පරිදි පළමුවැනි පාර්ශ්වය නියෝජනය නොකරන සුළුතර සාමාජිකත්වයක් දරන වෘත්තීය සමිති කීපයක් සමග ආයතනය විධායක සහ විධායක නොවන ශ්‍රේණිවලට අදාළව සාමූහික ගිවිසුම් දෙකක් ඇතිකරගෙන ඇති අතර ඒ මගින්,

    1. විධායක සහ විධායක නොවන ශ්‍රේණීන්ගේ මූලික වැටුප 2017 වර්ෂය සඳහා 25%කින් ද, 2018 සහ 2019 වර්ෂයන් සඳහා 7.5 ක් බැගින් ද වැඩි කිරීමටත්,
    2. එකී ගිවිසුම් වලින් ප්‍රවාහන දීමනාවක්ව භුක්ති නොවිඳින විධායක සහ විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන්ට 10% ක ප්‍රවාහන දීමනාවක් ගෙවීමටත් ගිවිසුම්ගත වී ඇත.

- ඒ නිසා ප්‍රවාහන දීමනාව මූලික වැටුප පදනම් කරගෙන නිර්ණය කරනු ලබන නිසා ඉහළ වැටුප් ලබන විධායක ශ්‍රේණිවලට වැඩි වාසිදායක ප්‍රවාහන දීමනාවක් හිමිවන අතර අඩු වැටුප් ලබා ගන්නා ශ්‍රේණිවලට අනුපාතිකව අඩු ප්‍රවාහන දීමනාවක් හිමිවෙයි.

- ඉන් පසුව විධායක කළමනාකරණ ශ්‍රේණිවල නිලධාරීන්ට 2017 වර්ෂයේ සිට බලාත්මක සාමූහික ගිවිසුමෙන් බාහිරව රු. 10,000/- ක අතිරේක මාසික ප්‍රවාහන දීමනාවක් ලබාදී ඇත.

- එය එක් අතකින් ප්‍රවාහන දීමනාවේ බරපතල විෂමතාවක් ඇති කරන අතර අනෙක් අතින් එය එවකට බලාත්මකව පැවැති සාමූහික ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කිරීමක් ද වේ.

- ඒ නිසා විධායක කළමනාකරණ ශ්‍රේණිවලට ප්‍රාමාණික නොවන වාසිදායක ප්‍රවාහන දීමනාවක් ලබාදීමෙන් අනිකුත් ශ්‍රේණිවලට බරපතළ අසාධාරණයක් සිදුවී ඇත.

- එම නිසා එම අසාධාරණය සමනය කිරීම සඳහා පළමුවැනි පාර්ශ්වය විසන් ඔවුන්ගේ පළමුවැනි ප්‍රකාශය සමග ඉදිරිපත් කළ විකල්ප යෝජනා අතුරින් එකක් ප්‍රදානය කොට සහනයන් ලබා දිය යුතු බවට ඉල්ලීම් කර ඇත.

දෙවන පාර්ශ්වයේ ස්ථාවරය

බේරුම්කරණ විභාගය ආරම්භයේ දී දෙවැනි පාර්ශ්වය විසින් ගෙන එන ලද මූලික විරෝධතා තවදුරටත් තහවුරු කරයි. ඊට අතිරේකව ඔවුන් ගොඩනැගූ ස්ථාවරයන් පහත සම්පිණ්ඩනය කර දක්වමි.

- විධායක කළමනාකරණ ශ්‍රේණිවලට අයත් වන I, II සහ III ශ්‍රේණිවල නිලධාරීන්ට වැඩි කළ බවට මෙම යොමුවේ සඳහන් වන රු. 10,000/- ක දීමනාව අතිරේක ප්‍රවාහන දීමනාවක් නොව 2011 වර්ෂයේ සිට ඔවුන්ට ගෙවමින් සිටි වාහන කුලී දීමනාවේ වැඩි කිරීමකි. එකී තර්කය අනුව,

    1. එය ප්‍රවාහන දීමනාවක් නොව, වාහන කුලී දීමනාවකි.
    2. එය අතිරේක දීමනාවක් නොව, ලබාදෙන දීමනාවකම වැඩි කිරීමකි.

- ආයතනය විසින් විධායක නොවන නිලධාරීන්ට ද ප්‍රමාණවත් ප්‍රවාහන දීමනාවක් දෙනු ලැබේ.

- 2011 වර්ෂයේ දී ඉහත කී කළමනාකරණ විධායක ශ්‍රේණිවල නිලධාරීන්ට ලබා දුන් වාහන කුලී දීමනාව වැඩි කරන්නට යෙදුනේ ඉන් වසර හයකට පසුව එනම් 2017 දී බව සහ එය කාලයේ අවශ්‍යතාව මත සිදු කෙරුණකි.

- විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන්ට වාර්ෂිකව ප්‍රවාහන දීමනාව වැඩි වී ඇත.

- ආයතනයේ එක් එක් ශ්‍රේණිවල සේවයේ නියුතු නිලධාරීන්ට පැවරෙන රාජකාරීන් වෙනස්වන අතර, විධායක කළමනාකරණ ශ්‍රේණිවල නිලධාරීන්ට ඔවුන් ඉටුකරන රාජකාරිවල ස්වභාවයන් අනුව වෙනස් ආකාරයේ දීමනාවන් ලැබීමට ඔවුන් ස්වභාවිකව හිමිකම් ලැබීම සාධාරණය.

**නිරීක්ෂණ සහ නිගමන**

- මෙම ආරාවුල ආරම්භයේදීම දෙවන පාර්ශ්වය විසින් ගෙන එන ලද මූලික විරෝධතා සාක්ෂි විභාගයකින් ඉදිරිපත් කරනු ලබන සාධක මගින් තහවුරු කිරීමට ඉඩ සලසා දෙන ලදී.

- සාමූහික ගිවිසුම් මගින් ආවරණය වන කරුණු පදනම් වන විට බේරුම්කරණ විභාගයක් පැවැත්වීම කළ නොහැකි බව Chas P. Haleys and Co. Ltd V. Commercial and Industrial Workers (1995) 2 SLR 42 ඇතුළු විනිශ්චිත නඩු තීන්දු රාශියකින් තහවුරු කරනු ලැබ ඇත. ඒ අනුව මෙම ආරාවුල සම්බන්ධ බේරුම්කරණ විභාගයක් පැවැත්වීමේ නෛතිකභාවය ගැන බේරුම්කරණයේ සැළකිල්ල යොමු විය. එහිලා පහත සඳහන් කරුණු පිළිබඳව බේරුම්කරණයේ අවධානය යොමු කෙරිණි.

  1. 2011 - 2013 සහ 2013 - 2016 වර්ෂවලට අදාළ විධායක සහ විධායක නොවන පළමුවැනි පාර්ශ්වය නියෝජනය කරන වෘත්තීය සමිති දෙකක් වන ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයත්, රක්ෂණ සේවක සංගමයත් අත්සන් කොට ඇත.
  2. 2016 - 2019 වර්ෂවලට අදාළ විධායක සහ විධායක නොවන සාමූහික ගිවිසුම් දෙකටම මෙහි පළමුවැනි පාර්ශ්වය නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, රක්ෂණ සේවක සංගමය සහ අන්තර් සමාගම් සේවක සංගමය යන වෘත්තීය සංගම් තුනම අත්සන් කොට නැත.

- ඒ අනුව තමන් අත්සන් කර නොමැති සහ එකඟතාවකට පත් නොවුනු සාමූහික ගිවිසුමකට ඇතුළත් කරුණු පිළිබඳව මෙබඳු හබකිරීමක් කිරීම ප්‍රශ්නගත බව මගේ නිරීක්ෂණය කෙරේ.

- තවද මෙම යොමුව සම්බන්ධ කරුණුවල ''ප්‍රවාහන දීමනාව'' යන ශීර්ෂය යටතේ එන බොහෝ කරුණු සාකච්ඡා වුවත්, ආරාවුල සම්බන්ධයෙන් වන දීමනා ආදිය ඉහත කී සාමූහික ගිවිසුම්වල කොන්දේසි වලින් පිටස්තරව කරන ලද ඒවා බව ද නිරීක්ෂණය විය.

- මෙම යොමුවේ ඇතුළත් නිලධාරී ශ්‍රේණියක් පිළිබඳව හබයක් මතුවිය. යොමුවේ සඳහන් වන්නේ ''ප්‍රවාහන දීමනාවක් ලබන විධායක නිලධාරීන් සඳහා 10% ක අමතර ප්‍රවාහන දීමනාවක්'' යනුවෙනි. මෙය විධායක නිලධාරීන් නොව කළමනාකරණ ගණයට අයත් වන විධායක I, II සහ III යන ශ්‍රේණිවල නිලධාරීන් බවට පැහැදිලි විය. මේ සම්බන්ධයෙන් පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දුන් සාක්ෂිකරු දිවාකර මහතා මෙසේ සාක්ෂි දී ඇත.

  ''ප්‍ර. මෙම විධායක ශ්‍රේණියේ කළමනාකරණ ශ්‍රේණි සඳහා ප්‍රවාහන දීමනාවක් ලබා දෙමින් තිබියදී ඔවුන්ට තවත් රු. 10,000/- ක ප්‍රවාහන දීමනාවක් ලබාදීමෙන් විධායක නොවන ශ්‍රේණියට අසාධාරණයක් වුණා කියල ද තමා මෙම ආරාවුල ගෙනල්ලා තියෙන්නේ?

  පි. එම ප්‍රශ්නය සංශෝධනය වෙන්න ඕනේ කළමනාකරණ නොවන ශ්‍රේණිවල විධායක සහ විධායක නොවන සියලුම අයට අසාධාරණයක් වුණා කියලා තමයි අපි කියන්නේ.'' (2019.10.02 දින කාර්ය සටහන් පිටු අංක 4)

- ඒ අනුව ආයතනයේ නිලධාරීන්/සේවක පිරිස් පහත සඳහන් ශ්‍රේණි වශයෙන් කාණ්ඩ වේ.

  විධායක ශ්‍රේණි:

  විධායක I }<br>
  විධායක II } කළමනාකරණ විධායක ශ්‍රේණි<br>
  විධායක III }<br>
  විධායක IV කළමනාකරණ නොවන විධායක ශ්‍රේණි

  විධායක නොවන ශ්‍රේණිවලට ලිපිකරු, තාක්ෂණික, ලිපිකරු නොවන සහ සුළු සේවක යන රැකියා කාණ්ඩ අයත් විය.

- මෙම ආරාවුල සම්බන්ධ රු. 10,000/- ක වාහන කුලී දීමනාව වැඩිකර දී ඇත්තේ ඉහත සඳහන් කළමනාකරණ කාණ්ඩයට වැටෙන විධායක I, II සහ III යන ශ්‍රේණිවලට අයත් වන නිලධාරීන්ට ය. ඒ අනුව මෙම ආරාවුල නිශ්චිත වශයෙන් අදාළ වන්නේ කළමනාකරණ කාණ්ඩයට නොවැටෙන විධායක කාණ්ඩයේ IV වැනි ශ්‍රේණියේ නිලධාරීන්ටත්, විධායක නොවන ශ්‍රේණිවල නිලධාරී/සේවකයින්ටත්ය.

- ඉහත කී කළමනාකරණ සේවා ගණයට අයත් විධායක I, II සහ III වන ශ්‍රේණිවල නිලධාරීන්ට ප්‍රශ්නගත රු. 10,000/- ක වාහන කුලී දීමනාව මුලින්ම ලබා දී ඇත්තේ 2011 වර්ෂයේ දී වන අතර එය සිදුකර ඇත්තේ 2011 සිට 2013 වර්ෂවලදී ක්‍රියාත්මකව පැවැති සාමූහික ගිවිසුමේ ප්‍රවාහන දීමනාවක් ගැන සඳහනක් කර නොතිබිය දී ය. එනම් එම දීමනාව ප්‍රදානය කර ඇත්තේ බලාත්මක සාමූහික ගිවිසුමෙන් පරිබාහිරවය.

- 2013 - 2016 විධායක සහ විධායක නොවන ශ්‍රේණි සඳහා වූ සාමූහික ගිවිසුම්වල අංක 8 යටතේ ප්‍රවාහන දීමනාව ගැන සඳහන් වන්නේ මෙසේය.

  ''දැනට ප්‍රවාහන දීමනාව භුක්ති නොවිඳින විධායක නොවන නිලධාරීන්හට ප්‍රවාහන දිරිදීමනාව ලබාදීමට සේවායෝජක විසින් එකඟ වේ. ඉහත දැක්වූ ප්‍රතිපාදනය වර්තමානයේ ප්‍රවාහනය සම්බන්ධව ප්‍රතිලාභ භුක්ති විඳින විධායක නිලධාරීන්ට අදාල කර නොගත යුතුය. දැනට ප්‍රවාහනය සම්බන්ධ ප්‍රතිලාභ භුක්තිවිඳින නමුත් එම දීමනාව මූලික වැටුපෙන් 10%ක අගයක් නොගන්නා විධායක නොවන නිලධාරීන්ට එම හිඟ ප්‍රමාණය ගෙවීමට එකඟ වනු ඇත.''

- 2016 - 2019 විධායක සහ විධායක නොවන ශ්‍රේණි සඳහා වූ සාමූහික ගිවිසුම්වල අංක 8 යටතේ ප්‍රවාහන දීමනාව ගැන සඳහන් වන්නේ මෙසේය.

  ''දැනට ප්‍රවාහන දීමනාව භුක්ති නොවිඳින විධායක නොවන නිලධාරීන්හට මූලික වැටුපෙන් 10%ක ප්‍රවාහන දිරිදීමනාවක් ලබාදීමට සේවායෝජක විසින් එකඟ වේ. ප්‍රවාහන දිරි දීමනාව මාසිකව ගෙවිය යුතු බවද ඉහත දැක්වූ ප්‍රතිපාදනය වර්තමානයේ ප්‍රවාහනය සම්බන්ධව ප්‍රතිලාභ භුක්තිවිඳින විධායක නිලධාරීන්ට අදාල කර නොගත යුතුය.''

- සාක්ෂි විභාගය පුරාම දෙවැනි පාර්ශ්වය හබ කළ ඉතා වැදගත් කරුණක් වූයේ කළමනාකරණ විධායක ශ්‍රේණිවලට ප්‍රදානය කරනු ලැබූ රු. 10,000/- ක දීමනාව කිසිසේත් ප්‍රවාහන දීමනාවක් නොව වාහන කුලී දීමනාවක් බව ඒත්තු ගැන්වීමයි. ඒ බව ආරම්භයේදී මෙම බේරුම්කරණ විභාගයේ අංක 2 පිළිගැනීම වශයෙන් ලකුණු කොට ඇත. දිවාකර මහතාගේ සාක්ෂියෙන් ද එය තහවුරු කොට ඇත.

- ඒ අනුව මෙම ශ්‍රේණිය සඳහා ආයතන විසින් ප්‍රදානය කරනු ලැබ ඇති එකී දීමනාව ප්‍රවාහනය සඳහා උපයෝගී කර ගැනීම සඳහා අදාළ වුවත් එය ලබා දී ඇත්තේ වාහන කුලී දීමනාවක් යන විශේෂ දීමනාවක් වශයෙන් බව පැහැදිලිය.

- ආයතනය විසින් ප්‍රදානය කරන ලද ප්‍රවාහන දීමනාව හැමවිටම මූලික වැටුපේ ප්‍රතිශතයක් වූ අතර වාහන කුලී දීමනාව ස්ථිර මුදල් අගයක් ගැණුනි. ආයතනයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී (වැඩ බලන) මාලක බණ්ඩාර මහතාගේ සාක්ෂියෙන් ද එය තහවුරු විය.

- පළමු පාර්ශ්වය ගොඩනැගූ ප්‍රමුඛ ස්ථාවරයක් වූයේ ප්‍රවාහන කටයුතු අරභයා කළමනාකරන විධායක ශ්‍රේණිවල නිලධාරීන්ට අතිරේක රු. 10,000/- ක දීමනාවක් සහ ඉන්ධන දීමනාවක් එකතුකොට ලබා දෙන ලද අතර, විධායක නොවන නිලධාරීන්ට 2017 දී 25%කින්, 2018 දී 7.5%කින් සහ 2019 දී 7.5%කින් වාර්ෂිකව කරන ලද වැටුප් වැඩිවීම් පදනම් කරගෙන සියයට දහයක ප්‍රවාහන දීමනාවක් පමණක් ලබාදීමෙන් තමන්ට බරපතල මූල්‍ය ප්‍රතිලාභයන්ගේ අවාසියක් සිදුවන බවයි.

- බේරුම්කරණ විභාගයේදී 2020.07.06 සහ 2022.12.08 දිනවලදී වැටුප් පත් ලකුණුකොට ඉදිරිපත් කරමින් සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්නකොට ඉහතින් සඳහන් කළ විෂමතාව ඒත්තු ගැන්වීමට පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා ගත් උත්සාහය ඉතා ප්‍රශංසනීය වේ. එමගින් උත්සාහ ගත්තේ ප්‍රවාහනය සඳහා වන පොදු පැකේජය යටතේ නිලධාරී ශ්‍රේණි දෙකට ලැබෙන ප්‍රතිලාභයන්හි පවතින බරපතල වෙනස නිසා අවසාන වශයෙන්

එක් කාණ්ඩයකට සිදුවන අසාධාරණය මතුකර පෙන්වීමටය. ඒ නිසා කළමනාකරණ විධායක ශ්‍රේණියේ නිලධාරියෙකුට අවසාන ප්‍රවාහන දීමනා පැකේජය වශයෙන් රු. 50,000/- ක් හෝ රු. 40,000/- ක් ලැබෙන විට, එය මූලික වැටුපෙන් 50%ක් පමණ වන බවත්, අනෙක් ශ්‍රේණිවලට ලැබෙන්නේ මූලික වැටුපින් 10%ක පමණ මුදලක් පමණක් බවත් ඒත්තු ගැන්වීමට ඔවුහු වෑයම් කළේය.

- විධායක ශ්‍රේණිවල නිලධාරීන්ට පැවරෙන රාජකාරිවල ස්වභාවය එහි සේවකයින්ට වැටුප් හා දීමනා තීරණය කිරීමේදී ඉතා වැදගත් සාධකයක් වේ. ඒ නිසා ක්ෂේත්‍ර රාජකාරි, රාජකාරි ගමන් බිමන්, සේවා ස්ථානයෙන් බැහැර රාජකාරි, දුරස්ථාන රාජකාරි ආදිය ආයතනයක නිලධාරීන් අතුරින් වැඩිකොට පැවරෙන්නේ කළමනාකරණ සහ විධායක ශ්‍රේණිවල නිලධාරීන්ටය. ඒ නිසා සෙසු නිලධාරීන්ට වඩා ප්‍රාමාණිකව ප්‍රවාහනය සඳහා වැඩි දීමනාවක් එම කාණ්ඩයේ නිලධාරීන්ට ලබාදීම ප්‍රායෝගික කාරණයකි. විශේෂයෙන්ම ස්වකීය වාහනය රාජකාරි කටයුතු සඳහා භාවිත කරන නිලධාරියෙකුට 2017 වකවානුවේ සිට රටේ ඉන්ධන මිල ඉහළයාම නිසා ඇතිවූ අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් වාහන සඳහා වැඩි දීමනාවක් ලබාදීම අත්‍යවශ්‍ය වූ කරුණක් ලෙස සැළකිය හැකිය.

- කෙසේ වුවත් එම දීමනාවල අනුපාතය 50% සහ 10%ක් අතර පරාසයක විහිදීයාම සාධාරණ සීමාවන් ඉක්මවා ගිය කාරණයක් බව පළමුවැනි පාර්ශ්වයේ විග්‍රහය අනුව බේරුම්කරණය පිළිගනී.

- යොමුවේ දෙවැනි අංගය වන කවර සහනයන් ලබා දිය යුතු ද යන්න තීරණය කිරීමේ දී ප්‍රමාණාත්මකව සහ සංඛ්‍යාත්මකව එක් එක් සේවකයාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න වැදගත් වේ. අගතියට පත් වූ කාණ්ඩයන් ගැන අවධානය යොමු කළා මිස, බේරුම්කරණයේ සාක්ෂි විභාගයේදී කිසිදු අවස්ථාවක අවාසයට ලක් වූවා යැයි කියන නිලධාරීන් සහ සේවකයින්ගේ නාම ලේඛනයක්වත් ඉදිරිපත් වූයේ නැත. පරීක්ෂණය අවසානයේදී 2023.02.21 වැනි දින බේරුම්කරණය විසින් කරන ලද සඳහන ප්‍රකාරව පළමුවැනි පාර්ශ්වය විසින් 2023.06.12 වැනි දිනැතිව නිලධාරීන්/සේවකයින් 1101 දෙනෙකුගේ නම් ලැයිස්තුවක් සහ ඒ අයට ඉල්ලා සිටින මුදල් ප්‍රමාණයක් දැක්වෙන ලේඛනයක් ගොනුකර ඇත. පළමුවැනි පාර්ශ්වයේ පළමුවැනි ප්‍රකාශයෙන් ඉදිරිපත් කරන ලද 4 වැනි විකල්පය ලෙස ගැනෙන සංකල්පය පදනම් කරගෙන ගණනය කරන ලද බව එහි සඳහන් වෙතත් එහි ඇති හිමිකම්වල නිරවද්‍යතාව පිළිබඳව කිසිසේත් තහවුරුවක් නොකෙරේ. ඇතැම් විට එය කල්පිත කරුණු මත පදනම් කරගෙන සකස් කරගත ලද්දක් බව පෙනී යයි. එම කාරණය වඩාත් පැහැදිලි වන්නේ 2018.02.28 වෙනි දින ගොනුකරන ලද පළමුවැනි ප්‍රකාශයට යා කර ඇති ඇමුනුම්වලින් සහනය පතන සේවක සංඛ්‍යාව 1647 ක් ලෙස සඳහන් වී තිබීමෙනි. ගෙවීම් ලැයිස්තු සකස් කිරීමට පාදක කරගත් නිර්ණායකයන් සහ ගණනය කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදයනුත්, සේවක සංඛ්‍යාව නිශ්චය කර ගැනීමත් අවිනිශ්චිත තත්ත්වයක්ව පවතිද්දී එකී ලේඛනයේ සඳහන් සේවක පිරිසට ඉල්ලා ඇති ගෙවීම් කළහොත් බරපතළ ගැටලු රාශියකට ඉදිරියේදී මුහුණදීමට සිදුවනු නියතය. ඒ නිසාම විසඳීමට අපහසු වන සංකීර්ණ කාර්මික ආරවුල් රාශියක් ඉන් උපචිතවීම වැළැක්විය නොහැකිය. මෙම නිගමනයට එළැඹීමේදී 2023.06.12 දින ගොනු කරන ලද ලේඛනය සම්බන්ධයෙන් දෙවැනි පාර්ශ්වය විසින් ගොනුකර ඇති විරෝධතා ද බෙහෙවින් සැළකිල්ලට ගැනුණි.

- කෙසේ වුවද ඉහතින් දැක්වූ පරිදි ආයතනයේ සේවක කාණ්ඩ දෙකකට ලබා දෙන දීමනාවල බරපතළ වෙනස්කම් නිසා එක් පාර්ශ්වයකට සිදුවිය හැකි අගතියත් සිත්තැවුලත් බැහැර කළ නොහැකි අතර ඒ සඳහා යම් විසඳුමක් මෙම ප්‍රදානයේදී දිය යුතුව ඇත. නිශ්චිත මුදල් ප්‍රදානයක් ලබාදීමට මෙම ප්‍රදානයෙන් ලබා දිය නොහැකි වුවත් මීළඟට එළඹෙන සාමූහික කේවල් කිරීම් ක්‍රියාවලියේදී මෙය විශේෂ කාරණයක් ලෙස ගෙන ආයතනයේ කළමනාකාරිත්වය නම්‍යශීලීව සහ යුක්ති සහගත සහ සාධාරණ ප්‍රවේශයක් භාවිත කොට ප්‍රවාහන දීමනා පැකේජයේ පවතින බරපතළ විෂමතාව සමනය කිරීමට කොන්දේසි සාකච්ඡා මාර්ගයෙන් එකඟතාවකට පැමිණ සාමූහික ගිවිසුමක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතු බවට නිගමනය කරමි. එහි දී පළමුවැනි පාර්ශ්වය විසින් ගොනු කර ඇති පළමුවැනි ප්‍රකාශයේ ඇමුණුම්ල සඳහන් පරිදි අසාධාරණයට ලක්ව ඇති නිලධාරී/සේවක පිරිසට දැනටමත් ලබන 10%යේ ප්‍රවාහන දීමනාව වෙනුවට අවම වශයෙන් මූලික වැටුපෙන් 20%ක් දක්වා වැඩි කිරීම සුදුසු බව ද නිගමනය කරමි.

- එහිදී 2017 වර්ෂයේ සිට ගත වූ කාලයට සාධාරණ ගැලපුමක් මගින් ලබා දිය හැකි හිඟ ප්‍රවාහන දීමනාවක් ද සාකච්ඡා මාර්ගයෙන් එකඟතාවකට පැමිණ තීරණය කරගත යුතු බව ද නිගමනය කරමි.

ප්‍රදානය

1. කාර්මික ආරාවුලට සම්බන්ධ පළමුවැනි අංගය සැළකිල්ලට ගත් කළ ආයතනයේ කළමනාකරණ කාණ්ඩයට වැටෙන විධායක I, II සහ III යන ශ්‍රේණිවලට 2017 සිට ලබා දී ඇති රු. 10,000/- ක් වන ප්‍රවාහන වාහන කුලී දීමනාව නොලබන සෙසු විධායක IV වැනි ශ්‍රේණියේ නිලධාරීන්ටත්, විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන් සහ සේවක කොටස්වලටත් යම් සහනයක් ලබා සළසා දීම සාධාරණ වේ.

2. එහෙත් 2023.06.12 දින ගොනුකර ඇති නිලධාරී/සේවක ලැයිස්තුවේ නම් සඳහන් පිරිසට ගෙවන ලෙස දක්වා ඇති හිඟ ප්‍රවාහන දීමනාවන් පිළිබඳ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි. ඒ අනුව ආයතනය විසින් මේ අවස්ථාවේ දී පළමුවැනි පාර්ශ්වයට ගෙවීමක් නොකළ යුතු බවට මෙම ප්‍රදානයෙන් සනාථ කෙරේ.

3. 2024 වර්ෂයේ සිට ඉදිරි කාලපරිච්ඡේදයන් සඳහා සාමූහික ගිවිසුම් සකස් කරන අවස්ථාවේදී ප්‍රවාහන දීමනා විෂය විශේෂ කරුණක් ලෙස ගෙන මේ වන විටත් වැටුපෙන් 10% ලෙස ගණනය කොට ගෙවන ප්‍රවාහන දීමනාව අවම 20% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දක්වා වැඩි කොට කළමනාකරණ නොවන විධායක නිලධාරීන්ටත්, විධායක නොවන නිලධාරීන්ටත් ගෙවිය යුතු බවට මෙම ප්‍රදානයේ දී තීරණය කරමි.

4. 2017 සිට ගත වූ පසුගිය කාලට අදාල හිඟ ප්‍රවාහන දීමනා ගෙවීමට ඇති හැකියාව සළකා බලා ඉහත කී සාමූහික ගිවිසුම් ක්‍රියාවලියේ දී එකඟත්වයකට එළැඹිය යුතු බවට තීරණය කරමි.

5. 2024 වර්ෂයේ වර්ෂයෙන් ඇරඹෙන කාලය සඳහා මේවන විටත් සාමූහික ගිවිසුමක් ගිවිසගෙන පවතී නම්, ඉදිරියට ඇති ඉතිරි කාල පරිච්ඡේදය සඳහා ඉහත කී 3 සහ 4 ප්‍රදානයන් ක්‍රියාත්මක කිරීම සඳහා එසේ පවත්නා සාමූහික ගිවිසුම්වලට අතිරේකයන් එකතු කිරීමට කටයුතු කළ යුතු බවට ද තීරණය කරමි.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2024 අගෝස්තු මස 20 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

EOG 10 – 0114

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.